පරිසර අමාත්‍යාංශය

# මාධ්‍ය නිවේදනය

## ලෝක ඕසෝන් දිනය - 2022
## "ජීවයේ පැවැත්ම සුරක්ෂිත කිරීම සඳහා ගෝලීය සහයෝගීතාව"

ලෝක ඕසෝන් දිනය සෑම වසරකම සැප්තැම්බර් 16 දින සමරනු ලැබේ. 2022 වසර සඳහා තේමාව වන්නේ "Montreal Protocol@35: ජීවයේ පැවැත්ම සුරක්ෂිත කිරීම සඳහා ගෝලීය සහයෝගීතාව" යන්නයි.

පෘථිවියේ ඕසෝන් ස්ථරය ක්ෂය කිරීමට හා ගෝලීය උණුසුම ඉහළ යාමට බොහෝ රසායනික ද්‍රව්‍ය හේතු වේ. එම රසායනික පරිභෝජනය සහ නිෂ්පාදනය ක්‍රමක්‍රමයෙන් ඉවත් කිරීම මඟින් ඕසෝන් ස්ථරය ආරක්ෂා කිරීමට ඇති කරගත් ගෝලීය එකඟතාවයක් වශයෙන් ඕසෝන් ස්ථරය ක්ෂය කරන ද්‍රව්‍ය පිළිබඳ මොන්ට්‍රියල් සන්ධානය හැඳින්විය හැකිය. එමඟින්, ගෝලීය වශයෙන් එකඟ වූ ප්‍රායෝගික, ක්‍රියාකාරී කාර්යයන් සමූහයක් ඉදිරිපත් කරයි. මෙම සුවිශේෂී ගිවිසුම 1987 සැප්තැම්බර් 16 දින අත්සන් කරන ලදී. එහෙයින්, සැප්තැම්බර් 16 ලෝක ඕසෝන් දිනය ලෙස නම් කර ඇත.

දේශගුණික විපර්යාස කෙරෙහි මොන්ට්‍රියල් සන්ධානය ඇති කරන පුළුල් බලපෑම 2022 වසරේ තේමාව මඟින් හඳුනා ගෙන ඇත. දේශගුණික අභියෝගවලට මුහුණ දීම සඳහා අනාගත පරම්පරාව වෙනුවෙන් පෘථිවියේ ජීවය ආරක්ෂා කිරීම, ගෝලීය සහයෝගීතාව වර්ධනය කිරීම සඳහා හවුල්කාරිත්වයන් ගොඩනැගීම මෙහි දී අවධාරණය කෙරේ.

ශ්‍රී ලංකාව පිළිවෙළින් 1989 සහ 2018 දී මොන්ට්‍රියල් ප්‍රොටෝකෝලය සහ කිගාලි සංශෝධනය අපරානුමත කරන ලදී. 2008 දී ක්ලොරෝෆ්ලෝරෝකාබන් ආනයනය තහනම් කිරීමෙන් සහ 2013 සිට කෝටා ක්‍රමවේදයක් හරහා හයිඩ්‍රෝක්ලෝරෝෆ්ලෝරෝකාබන් ආනයනය සීමා කිරීමෙන් ශ්‍රී ලංකාව ගෝලීය ඉලක්ක වෙත දායක වී ඇත.

ලෝක ඕසෝන් දිනය සැමරීම සඳහා පරිසර අමාත්‍යාංශය විසින් ජාතික උත්සවයක් සංවිධානය කර ඇත. එය 2022 සැප්තැම්බර් 16 වන දා සොබාදම් පියස ශ්‍රවනාගාරයේ දී පැවැත්වීමට නියමිත ය. විද්වත් දේශනයක්, පෙර ඉගෙනුම් ක්‍රියාවලිය ඇගයීමක් සහ ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය වෙත ශීතකාරක විශ්ලේෂණය කිරීමේ ජංගම උපකරණයක් බෙදා දීමත් මෙහිදී සිදුවේ. "2021/2022 - දේශගුණය සඳහා ඕසෝන්" චිත්‍ර තරඟයේ ජයග්‍රාහක ජයග්‍රාහිකාවන් වෙත මුදල් ත්‍යාග පිරිනැමීමත් ශීතකරණ හා වායු සමීකරණ ක්ෂේත්‍රයේ කාන්තා සහභාගීත්වය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා බාලදක්ෂිකාවන් වෙනුවෙන් ඕසෝන් මිතුරු ලාංඡණයක් හඳුන්වා දීමත් උත්සවයේ දී සිදුවේ.